**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථක : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

පෙබරවාරි 1, 2013

# උතුරු නැගෙනහිර පළාත්වල නැවත පදිංචිවූ ප්‍රජාවගේ ජීවනෝපායන් නගා සිටුවීම සඳහා ජපන් රජයෙන් මිලියන 90ක ආධාරක්

උතුරු නැගෙනහිර පළාත්වල නැවත පදිංචිවූ ප්‍රජාවගේ ජීවනෝපායන් නගා සිටුවීමට ජපන් රජය විසින් ඇමරිකානු ඩොලර් 723,568 (දළ වශයෙන් රුපියල් මිලියන 90) ක් ජපන් රාජ්‍ය නොවන ආයතනයක් වන ජෙන් (JEN) ආයතනයට පරිත්‍යාග කරන ලදි

මෙම ව්‍යාපෘතිය හරහා කෘෂි ළිං වතුර පොම්ප සහ බීජ උතුරු නැගෙනහිර නැවත පදිංචි වූ පවුල් 350කට සෘජුව සහ වක්‍රව ප්‍රතිලාභ ලැබෙන අයුරින් ලබා දෙන අතර, ඒ තුලින් එම ප්‍රජාවට අවශ්‍ය ජලය ලබාදීමත් ජීවනොපායන් සහ ආහාර සුරක්ෂිතභාවය සාක්ෂාත් කිරීමත් මෙන් ම ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමටත් බලාපොරොත්තුවේ.

ශ්‍රී ලංකාවේ සාමයත් මධ්‍යම කාලින සහ දීර්ඝ කාලින සංවර්ධනයත් උදෙසා උතුරු සහ නැගෙනහිර නැවත පදිංචි වුවන්ගේ ජීවන තත්වයන් නගා සිටුවීමටත් යටිතල පහසුකම් නගා සිටුවීමටත් ජපන් රජය විසින් විශේෂ සහයෝගයක් ලබාදෙන අතර ඒ තුලින් ශ්‍රී ලංකාවේ සාමයත් තිරසාර සංවර්ධවයත් මෙන්ම සෞභාග්‍යද උදාවනු ඇතැයි යන්නද විශ්වාස කෙරේ.

ජෙන් (JEN) ආයතනයේ පරිපාලන සහ මුල්‍ය කටයුතු නිලධාරිනී වටනාබේ මහත්මිය පැවසුයේ ජෙන් (JEN) ආයතනය 1994 වසරේදී ආරම්භ කරන ලද්දේ ලෝකයේ ගැටුම්කාරී තත්වයන්ට සහ ස්වාභාවික විපත්වලට පත්වූවන්ට හදිසි ආපදා තත්වයන්හිදී උදව් උපකාර කිරීමේ අරමුණින් බවය. ශ්‍රී ලංකාවේ ජෙන් (JEN) ආයතනය ක්‍රියාත්මක වූයේ 2004 දී ඇතිවූ සුනාමි උවදුරත් සමගය. සුනාමියෙන් අවතැන් වූවන්ට පිහිට වී අවසන් වනවාත් සමගම යුද්ධයෙන් අවතැන් වූ නැගෙනහිර ජනතාවට පිහිට වීම සඳහා 2007 දී නැගෙනහිරත් 2009 දී උතුරේත් විවිධ ව්‍යාපෘති දියත් කල බවද ඇය වැඩිදුරටත් පැවසුවාය.

2013 පෙබරවාරි මස පලවන දින සිට ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ජනතාවගේ ජීවනෝපායන් නගා සිටුවීම සඳහා අවුරුද්දක ව්‍යාපෘතියක්ද පටන් ගන්නා ලදි.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්, ජෙන් (JEN) ආයතනයේ පරිපාලන සහ මුල්‍ය කටයුතු නිලධාරිනී විසා වටනාබේ මහත්මියත් අතර, 2013 පෙබරවාරි 1 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදි.

*　*　*


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp